# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2458/12 - 2025 ඔක්තෝබර් මස 13 වැනි සඳුදා - 2025.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ සහ 70 ඇ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, සහ එකී කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2019 මාර්තු මස 23 වන දින දරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් සංස්ථාගත කරන ලද බැවින්ද, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2013 ජූලි මස 09 වන දින අංක 1818/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම යන වචන දැක්වෙන සෑම තැනකම ඒ වෙනුවට "සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන ආදේශ කිරීමෙන් ඒ නියෝගය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඉහත කී වගන්ති ප්‍රකාර මින් පෙර කරනු ලැබ ඇති යම් නියමයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක්ම "සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

තවද, මේ නියෝගය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම 2013 ජූලි මස 09 වැනි දින අංක 1818/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් "කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, එකී "කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, එකී "කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, හෝ කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, "සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ක්‍රියාත්මක කරන ලද සේ සලකනු ලැබිය යුතු බවට ද මෙයින් නියම කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0136


1A - PG 7285 - 283 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*